# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**10 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය : පැය 1 යි

**I කොටස**

උපදෙස්

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති i, ii ,iii, iv යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

01. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,

1) රාජ සභාවයි 2) පුරවැසි සභාවයි
3) ගම් සභාවයි 4) සෙනට් සභාවයි

02. ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ සප්ත අපරිහානි ධර්ම අනුගමනය කළ ජනපදය වූයේ,

1) කෝසල ජනපදය 2) අංග ජනපදය
3) මගධ ජනපදය 4) වජ්ජි ජනපදය

03. රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාලන කටයුතු සම්බන්ධයෙන් ජනතා නියෝජිතයන්ගේ බලය ඉස්මතු වීමට බලපෑ විප්ලවය වන්නේ,

1) රුසියන් විප්ලවය යි. 2) ප්‍රංශ විප්ලවය යි
3) ඉංග්‍රීසි විප්ලවය යි. 4) ඇමරිකන් විප්ලවය යි

04. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක නොවීමට හේතුවක් වන්නේ,

1) ජනතාව තුළ ඇති අසමගිය යි. 2) ජන සංඛ්‍යාව අඩුවීම යි.
3) දේශපාලන මතිමතාන්තර යි. 4) සමාජය සංකීර්ණ වීම යි.

05. "ප්‍රජාතන්ත්‍රවාදය'' යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයයි." ඉහත ප්‍රකාශය කරන ලද්දේ,

1) සීලර් විසිනි. 2) ඇරිස්ටෝටල් විසිනි.
3) ඒබ්‍රහම් ලින්කන් විසිනි. 4) මහාචාර්ය ගානර් විසිනි.

06. රට තුළ නීත්‍යානුකූල ව එක් දේශපාලන පක්ෂයක් ක්‍රියාත්මක වන රටකට උදාහරණයක් වන්නේ,

1) මහා බ්‍රිතාන්‍ය 2) ඉන්දියාව
3) රුසියාව 4).උතුරු කොරියාව

07. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කිරීමේ ප්‍රධාන නිර්ණායක දෙක වන්නේ

1) භූමිය හා ජනවර්ගය 2) භූමිය හා ජන ඝනත්වය
3) භූමිය හා ජනගහනය 4) භූමිය හා ආගම්වල පැතිරීම

08. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිලිව දක්නට ලැබෙන්නේ,

1) මහ මැතිවරණයකදීය 2) ජන මත විචාරණයකදීය
3) පළාත් සභා මැතිවරණයකදීය 4) පළාත් පාලන මැතිවරණයකදීය

09. යුරෝපයේ බිහි වූ ජාතික රාජ්‍යයන් දෙක වන්නේ,

1) ප්‍රංශය හා පෘතුගාලය යි. 2) ප්‍රංශය හා එංගලන්තය යි.
3) ඕලන්දය හා පෘතුගාලය යි. 4) ඕලන්දය හා එංගලන්තය යි.

10. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක ගණන වන්නේ,

1) 22 කි 2) 24 කි
3) 25 කි 4) 20 කි

11. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක විධායකය ලෙස සලකන්නේ,

1) ඇමතිවරුන්ය 2) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ය
3) අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලය 4) ජනාධිපති ප්‍රමුඛ ඇමති මණ්ඩලය

12. ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා තෝරා පත්කර ගනු ලබන මැතිවරණය වන්නේ,

1) මහමැතිවරණයයි 2) ජනාධිපතිවරණයයි
3) ජන මත විචාරණයයි 4) පළාත් පාලන මැතිවරණයයි

13. ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන කාර්ය වන්නේ,

1) නීති සම්මත කිරීම 2) නීති ක්‍රියාත්මක කිරීම
3) යුක්තිය පසඳලීම 4) ජනාධිපති පත් කිරීම

14. රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ආයතනයකි,

1) රාජ්‍යය 2) අධිකරණය
3) ආණ්ඩුව 4) පාර්ලිමේන්තුව

15. නීතිමය යුතුකම් වර්ගයකට අයත් යුතුකමක් වන්නේ,

1) වැඩිහිටියන්ට ගරු කිරීම 2) සම්ප්‍රදායන් සුරැකීම
3) සිරිත් විරිත් පිළිපැදීම 4) පවතින නීතියට ගරු කිරීම

16. "සෑම ආකාරයක ම අධිකාරි බලය එක් මධ්‍යම බල ආයතනයක් තුළ ඒකරාශී වී තිබේ නම් එය ඒකීය ආණ්ඩු ක්‍රමයක් වේ." ඉහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ,

1) මහාචාර්ය ඒ. වී. ඩයිසි විසින් ය. 2) මහාචාර්ය සී. එෆ්. ස්ට්‍රොන්ග් ය.
3) මහාචාර්ය හර්මන් ජේ. ෆයිනර් ය. 4) මහාචාර්ය කේ. සී. වියරේ ය.

17. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කරන සංකල්පය යටතේ ගම් පාලනය සඳහා "ගම්භාර", "ගාමිණී" වැනි නිලධාරින් පත්කළ යුගය වන්නේ,

1) ලන්දේසි යුගයයි 2) පොලොන්නරු යුගයයි
3) අනුරාධපුර යුගයයි 4) බ්‍රිතාන්‍ය යුගයයි

18. පරමාධිපත්‍ය බලයට ඇතුළත් නොවන දේ වන්නේ,

1) පාලන බලතල 2) මූලික අයිතිවාසිකම්
3) ඡන්ද බලය 4) අධිකරණ බලතල

19. ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයක පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කරන්නේ,

1) ප්‍රාදේශීය ලේකම් තුමාය 2) සංවර්ධන නිලධාරි තුමාය
3) ග්‍රාමනිලධාරි තුමාය 4) මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමාය

20. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම හඳුන්වන්නේ,

1) බලය බෙදා හැරීම ලෙසය 2) බලය විමධ්‍යගත කිරීම ලෙසය
3) බලය පවරා දීම ලෙසය 4) බලය හැසිරවීම ලෙසය

21. බලය විමධ්‍යගත කිරීම දැකගත හැකිවන ආණ්ඩුව වන්නේ,

1) සන්ධිය ආණ්ඩුව
2) ඒකීය ආණ්ඩුව
3) මධ්‍යම ආණ්ඩුව
4) රාජාණ්ඩුව

22. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම සඳහා බලය ලැබී ආති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වන්නේ,

1) 20 වන සංශෝධනය යි.
2) 15 වන සංශෝධනය යි.
3) 13 වන සංශෝධනය යි.
4) 19 වන සංශෝධනය යි.

23. පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධිකරණය සිදුකරන නියෝජිතයා වන්නේ,

1) ප්‍රධාන ඇමතිවරයා ය.
2) පළාත් ආණ්ඩුකාරවරයා ය.
3) පළාත් ලේකම්වරයා ය.
4) පළාත් මන්ත්‍රීවරයා ය.

24. පළාත් සභා පිහිටුවීමේදී මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව යන ආයතන දෙක පොදුවේ භුක්ති විඳින බලතල දැක්වෙන්නේ,

1) පළාත් සභා බලතල ලයිස්තුවෙහි ය.
2) සංවෘත බලතල ලයිස්තුවෙහි ය
3) සමගාමී බලතල ලයිස්තුවෙහි ය
4) පොදු බලතල ලයිස්තුවෙහි ය

25. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත රාජ්‍යයට හිමි බලතල ඇතුළත් වන්නේ,

1) සෞඛ්‍ය හා මූලික කටයුතු පිළිබඳව ය.
2) සෞඛ්‍ය හා ජාතික ආරක්ෂාව පිළිබඳව ය.
3) අධ්‍යාපන හා මූල්‍ය කටයුතු පිළිබඳව ය.
4) අධ්‍යාපන හා සෞඛ්‍යය පිළිබඳව ය.

26. ඇමරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ,

1) පාර්ලිමේන්තුව ලෙසය
2) සෙනට් සභාව ලෙසය
3) කොංග්‍රස් මණ්ඩලය ලෙසය
4) මහ සභාව ලෙසය

27. ස්විස්ටර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශිය ආණ්ඩුව හඳුන්වන්නේ,

1) කැන්ටන් ලෙසය
2) ප්‍රාන්ත ලෙසය
3) ජනපද ලෙසය
4) මහජන සභාව ලෙසය

28. සන්ධිය මහා මණ්ඩලය ලෙස ව්‍යවස්ථාදායකය හඳුන්වන රට වන්නේ,

1) ප්‍රංශය
2) චීනය
3) එංගලන්තය
4) ස්විස්ටර්ලන්තය

29. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩුව අතර බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්වයන් මතු වුවහොත් එය විසඳීම සිදුකරන්නේ,

1) ජනාධිපති විසිනි
2) අගමැති විසිනි
3) ශ්‍රේෂ්ඨාධිකරණය විසිනි
4) කොංග්‍රස් මණ්ඩලය විසිනි

30. ඇමරිකා එක්සත් ජනපදයේ වර්තමාන ප්‍රාන්ත සංඛ්‍යාව,

1) 13 කි
2) 44 කි
3) 50 කි
4) 25 කි

31. ශ්‍රී ලංකා යෝනක ජන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ගත් විට,

1) 4.1 %ක් පමණ වේ
2) 9.2 %ක් පමණ වේ
3) 11.2 %ක් පමණ වේ
4) 7. 5 %ක් පමණ වේ

32. "වෙනස්කම් තුළින් එකමුතු බව" යන තේමාව බහු සංස්කෘතිකත්වයෙන් ප්‍රයෝජනයට ගත් රටක් වන්නේ,

1) ඉන්දියාව
2) ජපානය
3) ස්විස්ටර්ලන්තය
4) බ්‍රිතාන්‍යය

33.

A. - ගෝලීය පිහිටීම
B. - විජය ඇතුළු පිරිස පැමිණීම
C. - සේන ගුත්තික ආක්‍රමණය
D. - පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම
E. - ඉන්දියාවට ආසන්නව පිහිටීම

ඉහත ප්‍රකාශවලින් ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ සංක්‍රමණ ඇතුළත් ආකාර දැක්වෙන පිළිතුර වන්නේ,

1) A හා B ය
2) A හා C ය
3) D හා E ය
4) B හා D ය

34. "සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකොට ගන්නා වූ ද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගත්තා වූ ද සියලුම චර්යා රටාවන්ට දිය හැකි සාමූහික නාමය සංස්කෘතියයි " ඉහත නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

1) ටී. බී. ටයිලර් විසිනි
2) චාර්ල්ස් ඒ. එල්වුඩ් විසිනි
3) එබ්‍රහම් ලින්කන් විසිනි
4) ඇරිස්ටොටල් විසිනි

35. සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටකි,

1) ඇමරිකාව
2) ශ්‍රී ලංකාව
3) මාලදිවයින
4) සීෂෙල්ස්

36. යහපාලනයේ මූලික ගුණාංගයකි,

1) අයිතිවාසිකම් කඩ කිරීම
2) මහජනතාව රාජ්‍ය පාලනයට වගකීම
3) මාධ්‍ය නිදහස පිටුදැකීම
4) දූෂණ වංචාවෙන් තොරව රාජ්‍ය පාලනය

37. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත් ව කටයුතු කිරීමෙන්,

1) ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
2) නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජන එල්ල වේ.
3) එක් ජාතියක් හා එක් රටක් ලෙස හැඟීම් වර්ධනය නොවේ.
4) අන්තර් විවාහ සිදුවීම මඟින් වාර්ගික විවිධත්වය ඇති වේ.

38. ආගම් අනුව ශ්‍රී ලංකාවේ බෞද්ධ ආගම අදහන ජනතාව ප්‍රතිශතයක් ලෙස,

1) 70.2 % කි.
2) 79.4 % කි.
3) 80 % කි.
4) 69 % කි.

39. කැමති ආගමක් ඇදහීම අයත් වන්නේ යහපාලනයේ ,

1) දේශපාලන අංශයටය
2) සමාජ සංස්කෘතින අංශයටය
3) ආර්ථික අංශයටය
4) රාජ්‍ය අංශයටය

40. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීමට බලපෑ සංක්‍රමණයකි,

1) පඬුවස්දෙව් රජුගේ පැමිණීම
2) රොබට් නොක්ස්ගේ පැමිණීම
3) එළාරගේ පැමිණීම
4) ඉබන් බතුතාගේ පැමිණීම

(ල.40×1=40)

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

10 ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/ විභාග අංකයඃ ....................................... කාලය : පැය 2 යි

### II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1)

i. ප්‍රජාතාන්ත්‍රවාදී පාලනයක ස්වරූප දෙක නම් කරන්න.

ii. ලෝකයේ බහු පක්‍ෂ ක්‍රියාත්මක වන රටවල් දෙකක් ලියන්න.

iii. ග්‍රීක ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ලක්‍ෂණ දෙකක් ලියන්න.

iv. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග දෙකක් ලියන්න.

v. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජනවර්ග දෙකක් ලියන්න.

vi. ජාතික රාජ්‍යයක් බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

vii. සන්ධිය ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකක් ලියන්න.

viii. ශ්‍රී ලංකාවේ ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

ix. රාජ්‍යකට පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.

x. සංස්කෘතියට අයත් අංග ලක්‍ෂණ දෙකක් ලියන්න.

(ලකුණු $10\times2 = 20$)

2)

i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දැකිය හැකි අංග ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල.02)

ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබියයුතු ලක්‍ෂණ 03 ක් සඳහන් කරන්න. (ල.03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් මාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)

3)

i. ක්‍රි.පූ. 6 වන සියවසයේ ඉන්දියාවේ වජ්ජි ජනපදයේ පැවති පාලන ක්‍රමය තුළ අනුගමනය කළ සප්ත අපරිහානි ධර්ම දෙකක් සඳහන් කරන්න. (ල.02)

ii. තරඟකාරී පක්‍ෂ ක්‍රමයක යහපත් ලක්‍ෂණ තුනක් ලියන්න. (ල.03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක කර ගැනීමට අවශ්‍ය සාධක තුනක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(ල.05)

4)

i. සන්ධි ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකක් ලියන්න. (ල.02)

ii. ඒකීය රාජ්‍යයක ලක්‍ෂණ තුනක් ලියන්න. (ල.03)

iii. සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්‍ෂණ තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

5)

i. පරමාධිපත්‍ය බලයට ඇතුළත් ප්‍රධාන සාධක දෙකක් සඳහන් කරන්න. (ල.02)

ii. ස්විස්ටර්ලන්තයේ සන්ධීය රාජ්‍යයක් බිහි කිරීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ල.03)

iii. ඇමරිකා එක්සත් ජනපදයේ සන්ධීය ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සතු බලතල තුනක් හා ප්‍රාන්ත රාජ්‍ය හිමි බලතල දෙකක් ලියන්න. (ල.05)

6)

i. සංකීර්ණ බහු සංස්කෘතික පවතින රටවල් දෙකක් ලියන්න. (ල.02)

ii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ හේතු තුනක් සඳහන් කරන්න. (ල.03)

iii. යහපාලනයක මූලික ගුණාංග තුනක් නම්කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

7)

i. "වෙනස්කම් තුළින් එකමුතු බව" තේමාව කර ගෙන ඉදිරියට පැමිණි රටවල් දෙකක් නම් කරන්න. (ල.02)

ii. බහු සංස්කෘතික සමාජයක ලක්‍ෂණ තුනක් ලියන්න. (ල.03)

iii. බහු සංස්කෘතික සමාජයක එක්සත්ව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රතිඵල තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)